# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

| 7 | බුද්ධ ධර්මය | 08 පාඩම |
|---|---|---|

පහත ඇති ද්විත්ව ජර්නලයේ දැක්වෙන විරති හෙවත් චාරිත්‍ර ශීල සමග ම ඉටු කළ යුතු සමාදාන හෙවත් චාරිත්‍ර ශීල (අ) යනුවෙන් සටහන් කර ඇති කොටුවේ අනුපිළිවෙළින් දක්වා ඇත. 1 තීරුවේ දැක්වෙන චාරිත්‍ර ශීලයට ගැළපෙන චාරිත්‍ර ශීලය (ආ) කොටුවෙන් තෝරා 2 තීරුවේ ඇති හිස් තැනෙහි ලියන්න.

උදාහරණයක් දක්වා ඇත.

(අ)

| 1. විරති/ චාරිත්‍ර ශීල | 2. සමාදාන / චාරිත්‍ර ශීල |
|---|---|
| උදා - සත්ත්ව ඝාතනයෙන් වැළකී සිටීම | සතුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම |
| 1. අන් සතු දේ සොර සිතින් නොගැනීම | |
| 2. වැරදි කායික සබඳතාවලින් වැළකීම | |
| 3. බොරු කීමෙන් වැළකීම | |
| 4. අසමගිය ඇතිවන වචන (කේලම්)නොකීම | |
| 5.සිත් රිදෙන වචන නොකීම | |
| 6. වැඩකට නැති වචන කීමෙන් වැළකීම | |
| 7. මත්වන දේවල් භාවිත නොකිරීම | |
| 8. තමා සත්ත්ව හිංසාවෙන් වැළකීම | |
| 9. අනුන් ලවා සත්ත්ව හිංසා නොකිරීම | |
| 10. සත්ත්ව හිංසාවට අනුබල නොදීම | |
| 11. තමා සොරකමින් වැළකීම | |
| 12. අන් අය ලවා සොරකම් නොකරවීම | |
| 13. සොරකම් අනුමත නොකිරීම හා සොරකමට අනුබල නොදීම | |
| 14. වන්දනා කරන විට වැරදි ඉරියව් වලින් වැළකීම | |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

| | |
|---|---|
| 15. අනෙක් ළමයින් පාඩම් වැඩ කරන විට ඊට බාධා නොකිරීම | |
| 16. පන්ති කාමරයේ ඝෝෂා නොකිරීම | |
| 17. පාඩම් වේලාවන්හි පන්තියෙන් පිටත නොසිටීම | |
| 18. අන් අය සමග නොගැළපෙන විහිළු නොකිරීම | |
| 19. ගුරු දෙමාපිය වැඩිහිටියන් හා ශිෂ්‍ය නායකයන් සමග එකට එක නොකීම | |
| 20. කළ වැරදි නොසැගවීම | |

(ආ)

* කළ වැරදි පිළි ගැනීම
* සිත් සැනසෙන වචන කීම
* අන් සතු දේ රැක දීම
* කුමර බඹසර කුමරි බඹසර රැක විවාහයෙන් පසු  කාම මිත්‍යාචාරයෙන් වැළකී පිරිසිදුව සිටීම
* සතුන්ට කරුණාව දැක්වීම
* සතුන් රැකීමට අනුබල දීම
*සත්‍ය වචන කතා කිරීම
* අනුන්  ලවා සතුන් ආරක්ෂා කරවීම
* අර්ථවත් දේ කීම
* මත් නොවන, සෞඛ්‍යයට හිතකර දේ භාවිත කිරීම
* සමගිවන වචන කීම
* පන්තියේ නිහඬ බව රැකීම
* අන් සතු දේ රැක දීම
* ගුරු දෙමාපිය වැඩිහිටියන් හා ශිෂ්‍ය නායකයන් සමග ගෞරවයෙන් කතා කිරීම
* අන් සතු දේ රැක දීමට අනුන්ව පෙළඹවීම
* අන් අය ලවා අනුන්ගේ දේපළ රැක දීම
* අන් අය සමගගැළපෙන විහිළු පමණක් කිරීම
* වන්දනා කරන විට ගැළපෙන ඉරියව් පැවැත්වීම
* ඔවුන්ගේ පාජඩම් වැඩට උදව් කිරීම
* නියමිත වේලාවල පන්තියේ රැඳී සිටීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk